## 29

# නුබුව්වත් ලැබීම

මුහම්මද්(සල්)තුමාණෝ සිය තරුණ අවධියේ දී ම තනි ව සිටීමට කැමැත්තක් දක් වූ හ. ඇස් ඉදිරිපිට සිදුවන අකුසල් ගැන සිතා කණගාටු වූහ. සිය සමාජයේ පහත් තත්ත්වය දැක එය තුරන් කිරීම සඳහා මග සෙවූ හ. දුකෙන් හා දුගී බවෙන් පිරුණු එතුමාගේ තරුණ ළමා අවධිය දැන් අවසන් ය. එහෙයින් එතුමා සිය සමාජයේ ප්‍රතිසංස්කරණ ගැන දැඩි ව කල්පනා කළහ. මක්කමට කිලෝමීටර පහක් පමණ දුරින් පිහිටි 'හිරා' නම් ගුහාවට ගොස් තනිව සිටිමින් අල්ලාහ් ගැන භාවනාවෙහි යෙදුණාහ.

දැන් එතුමාගේ වයස අවුරුදු 40 ට ආසන්නය. එතුමාණෝ නිතර නිතර යහපත් සිහින දුටුහ. සිහිනෙන් තමා දකින්නේ ජිබ්රීල් (අලෛ) බව නොදැන සිටිය ද ජිබ්රීල්(අලෛ) සිහිනෙන් දුටුහ. රමළාන් මාසයේ රාත්‍රියක ජිබ්රීල් (අලෛ) හිරාහි මුහම්මද් තුමා ඉදිරියේ පෙනී සිටියේ ය. (කියවන්න) 'ඉක්රඃ' යැයි පැවසුවේ ය. 'මම කියවීමට නොදනිමි' යි මුහම්මද් තුමාණෝ පිළිතුරු දුන්හ. එවිට ජිබ්රීල් (අලෛ) තුමා තෙවරක් මුහම්මද්(සල්) තුමා බදා වැළඳ ගත්තේ ය. සෑම වතාවේදීම තමා කියවීමට නොදන්නා බව මුහම්මද්(සල්) තුමාණෝ පිළිතුරු දුන්හ. තුන්වන වතාවේ දී ජිබ්රීල්(අලෛ) කියූ වාක්‍යය ඒ අයුරින් ම කට පාඩම් කර ගත්හ. ඒවා සූරා අලක්හි පළමු වාක්‍යය පහ වන්නේ ය. මෙය මුහම්මද්(සල්) තුමාට පහළ වූ පළමු වහීය හා නුබුවතයේ ආරම්භය ද වන්නේ ය. මෙතැන් පටන් නබි(සල්) තුමාණෝ නබි හෙවත් රසූල් යනුවෙන් හඳුන්වනු ලැබූහ.



හිරා ගුහාව

නබි(සල්)තුමාණෝ වහි පහළ වීමේ දී ඇති වූ කම්පනය නිසා ගැහෙන්නට වූහ. නිවසට ගිය එතුමාණෝ තමා පොරවන ලෙස බිරියගෙන් ඉල්ලා සිටියහ. පසුව හිරාහි සිදුවූ සිද්ධිය බිරිය වූ කදීජා තුමියට පැහැදිලි කළහ. සිය සැමියා අස්වසාලූ කදීජා තුමිය, වරකා බින් නෞෆල් යන

පඬිවරයා වෙතට සිය සැමියා කැඳවා ගෙන ගොස් සිද්ධිය විස්තර කළා ය. මෙය අසා සිටි වරකා බින් නව්ෆල් තුමා, මුහම්මද්(සල්) තුමාට නුබුව්වත් ලැබී ඇති බවත්, එතුමා වෙතට පැමිණියේ නබිවරුන්ට දූත පණිවිඩ ගෙනෙන ජිබ්රීල් නම් මලාඉකාවරයා බවත් පැහැදිලි කළේ ය. මෙයට කන් දුන් කදීජා තුමිය මුහම්මද්(සල්) තුමා නබි වශයෙන් පිළිගෙන ප්‍රථමයා ලෙස ඉස්ලාමය වැළඳ ගත්තා ය.

'අල්ලාහ් හැර අන් දෙවියෙකු නැත. මුහම්මද් (සල්) තුමා අල්ලාහ්ගේ දූතයා ය' යන්න නබි(සල්) තුමාගේ දේශනය විය. මෙය පිළිගන්නා ලෙස ජනයා කැඳවූහ. අබුබක්ර් (රලි) වැනි යහපත් මිනිස්සු එතුමා පිළිගෙන මුස්ලිම් වූහ. තම පැරණි ආගමේ එල්බ සිටි අය නබි(සල්) තුමාට විරුද්ධ වූහ. කවියා, ශාස්ත්‍රකාරයා, හූනියම්කාරයා යනාදී නම්වලින් හැඳින්වූහ. එතුමාගේ ගමන් කරන මාර්ගයේ කටු ඇතුරූහ. කුණු කසල හිස මත හෙලූහ. කුණු වූ ඔටු බඩවැල්වලින් මාල පැළඳූහ. දරුණු ලෙස පහර දුන්හ.

එපමණක් නොව එතුමන් විශ්වාස කළ මුස්ලිම්වරුන්ට හිංසා පීඩා කළහ. වද හිංසා කළහ. සමහරු මරා දමන ලදහ. මේ නිසා ආරක්ෂාව පතා හබෂාවට යවනු ලැබූහ. නබි (සල්) තුමා හා එතුමන්ගේ හිතවතුන් වසර තුනක කාලයක් තිස්සේ සිය සමාජයෙන් වෙන් කර තබනු ලැබූ හ. එයින් නිදහස්ව තායිෆ් නගරයට ගියහ. එහි දී එතුමන්ට පිළිගැනීමක් නො වී ය. ඉතා දැඩි ලෙස පහර දෙනු ලැබූහ. නැවත මක්කාවට පැමිණි තුන් වසරක දී මුස්ලිම්වරු හා නබි(සල්) තුමා මදිනාවට පදිංචියට ගියහ. මෙම ගමන 'හිජ්රත්' යනුවෙන් හැඳින්වේ.

**අභ්‍යාස** ☞

කෙටි පිළිතුරු දෙන්න.

1. හිරා ගුහාව පිහිටා ඇත්තේ කොහේ ද?
2. ප්‍රථම වහී පහළ වූ අවස්ථාවේ දී නබි තුමාගේ වයස කීය ද ?
3. පළමු වහීයේ පහළ වූ ආයත් අඩංගු වන්නේ කුමන සූරාවේ ද?
4. නබි යන අදහස ගෙන දෙන තවත් වචනයක් දෙන්න.
5. ප්‍රථම වහීය නිසා කම්පනයට පත් වූ නබි(සල්) තුමා හා බිරිය කවුරුන් හමුවීමෙන් සැනසුමට පත්වූවෝ ද ?
6. ප්‍රථමයෙන් ඉස්ලාමය වැළඳගත් කාන්තාව නම් කරන්න.
7. නබි(සල්) තුමාට වහී ගෙන ආ මලාඉකාවරයා කවුද?
8. නබි (සල්) තුමාගේ මූලික දේශනය කුමක් ද?.
9. නබි(සල්) තුමාට කාෆිර්වරු කළ හිංසා පීඩාවන් දක්වන්න.
10. මුස්ලිම්වරු ආරක්ෂාව පතා ගොස් රැඳී සිටි රට කුමක් ද?